# IV කාර්ය මණ්ඩල පුවත්

අධිපති, ඩී. ඩබ්ලිව්. රාජපතිරාන මහතා ජාත්‍යන්තර මුදල් මණ්ඩලයෙහි ලංකාවේ විකල්ප අධිපති වශයෙන් ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ ද, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ ද, ජාත්‍යන්තර මුදල් සමායතනයේ ද, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ද වාර්ෂික රැස්වීම් වලට සහභාගිවීම් වස් 1963 සැප්තැම්බර් 24 වැනි දින වොෂිංටනය බලා පිටත්ව ගියේ, 1963 ඔක්තෝබර් 11 වැනි දින පෙරළා ලංකාවට සැපත් විය.

1963 ජනවාරි මාසයේ දී කරච්චියේ පැවැත් වූ 'සියැන්සා' අධිපතීන්ගේ පස්වැනි සාකච්ඡා සම්මේලනයට අධිපති තුමා සහභාගි විය. 1963 ජනවාරි 28 වැනි දින කරච්චිය බලා පිටත් වූ එතුමා, 1963 පෙබරවාරි 7 වැනිද පෙරළා ලංකාවට පැමිණියේ ය.

1963 වසරේ මුල් භාගයේ දී, මුදල් මණ්ඩලයේ රජයේ සාමාජිකයාව සිටි එච්. එස්. අමරසිංහ මහතා වෙනුවට, එච්. ඊ. තෙන්නකෝන් මහතා 1963 ජූනි 11 වැනි ද සිට පත් කැරිණි. එච්. ඊ. තෙන්නකෝන් මහතා වෙනුවට 1963 දෙසැම්බර් 19 වැනි දින සිට එච්. ජේ. සමරක්කොඩි මහතා පත් කරන ලදී.

එච්. එස්. අමරසිංහ මහතා නොපැමිණි 1963 අප්‍රේල් මස 30 වැනි ද සිට මැයි 25 වැනිද දක්වා සහ එච්. ඊ. තෙන්නකෝන් මහතා නොපැමිණි 1963 සැප්තැම්බර් 23 වැනි ද සිට ඔක්තෝබර් 20 වැනිද දක්වා, වී. එස්. එම්. ද මෙල් මහතා මුදල් මණ්ඩලයේ රජයේ සාමාජිකයා වශයෙන් වැඩ බලන ලදී.

නියෝජ්‍ය අධිපති, ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ විකල්ප අධ්‍යක්ෂ ලෙස 1963 වසරේ දී තවදුරටත් එකී සේවාවෙහි නිරත විය. අධිපතිගේ සහකාර, ඩී. සී. ගුණසේකර මහතා නියෝජ්‍ය අධිපති වශයෙන් තවදුරටත් වැඩ බැලීමේ නිරත විය.

අධිපතිගේ සහකාර, පී.එම්. ජයරාජන් මහතා 1963 මාර්තු 1 වැනි දින සිට මහ බැංකු සේවාවෙන් අස් විය. ආචාර්ය ගාමිණී කොරයා මහතා ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන්, ඔහුගේ සේවාවට අමතරව, 1963 අප්‍රේල් 1 වැනි ද සිට අධිපතිගේ සහකාරවරයකු ලෙස පත් කරනු ලැබීය. එදින ම සිට, ඒ.එච්. අබේනායක මහතා මුදල් මණ්ඩලයේ ලේකම් සහ මහ බැංකුවේ ලේකම් වශයෙන් ඔහුගේ සේවාවට අමතරව අධිපතිගේ සහකාරවරයකු වශයෙන් පත් කරන ලදී. එස්.ඊ.පී. ජාන්ස් මහතා විනිමය පාලක වශයෙන් පත් කැරිණි.

ආහාර හා කෘෂිකර්මාන්ත සංවිධානයේ ඇරයුමක් ලැබ, 1963 ජනවාරි 20 වැනි දින ටෝකියෝව බලා ගිය ආචාර්ය ගාමිණී කොරයා මහතා කෘෂිකර්මය අතින් ජපානය ලබා ඇති අත්දැකීම් ආසියාතික රටවලට අදාළ වන ආකාරය පිළිබඳව හැදෑරීම සඳහා පැවැති විශේෂඥ සාකච්ඡා සම්මේලනයට සහභාගී වී 1963 පෙබරවාරි 6 වැනි දින පෙරළා ලක්දිවට පැමිණියේය. ආසියාවේ සහ ඈත පෙරදිග ආර්ථික සම්මේලනයේ විධායක ලේකම්ගේ ආරාධනාවක් ලැබ, නැවත ආචාර්ය ගාමිණී කොරයා මහතා ජිනීවාහී පැවැති වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ රැස්වීමකට සහභාගිවීම සඳහා 1963 ජූනි 29 වැනි ද සිට ජූලි 15 වැනිද දක්වා දිවයිනෙන් බැහැරව සිටියේය.

ආචාර්ය කොරයා මහතා, 1963 සැප්තැම්බර් 27 වැනි දින සිට 1964 ජනවාරි 7 වැනි ද දක්වා වූ කාල සීමාව තුළ දී වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ වූ එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ මහ ලේකම් ගේ උපදේශකයා වශයෙන් සේවය කිරීම සඳහා සේවාවෙන් මුද හරිනු ලැබීය.

බැංකු පරිපාලක, පී.වී.එම්. ප්‍රනාන්දු මහතා, 1963 සැප්තැම්බර් 17 වැනි දින සිට දෙසැම්බර් 20 වැනි දින දක්වා පැවැත් වුන එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයේ 18 වැනි සැසි වාරයේ නියෝජිතයකු ලෙස රජයෙන් පත් කැරිණි.

ආර්ථික පර්යේෂණ අංශයේ අතිරේක නියෝජ්‍ය අධ්‍යක්ෂ, එස්. කනේසදසන් මහතා බැංකොක්හි ආසියාවේ සහ ඈත පෙරදිග ආර්ථික සම්මේලනයේ එක්සත් ජාතීන්ගේ උපදේශකයා වශයෙන් සේවාව සඳහා මුදා හරින ලදී. ඒ මහතා මෙම කාර්යය සඳහා 1963 සැප්තැම්බර් 17 වැනිදා සිට 1964 ජනවාරි 13 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ දිවයිනෙන් බැහැරව සිටියේය.

ආර්ථික පර්යේෂණ අංශයේ අතිරේක නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආචාර්ය එස්.බී.ඩී. ද සිල්වා මහතා පිලිප්පයිනයේ, මැනිලාහි පැවැති ආසියාවේ සහ ඈත පෙරදිග ආර්ථික සම්මේලනයේ 19 වැනි සැසි වාරයට, විකල්ප නියෝජිතයකු ලෙස සහභාගි විය. ඒ සඳහා 1963 මාර්තු 5 වැනි දින සිට මාර්තු 27 වැනි දින දක්වා ඒ මහතා දිවයිනෙන් බැහැරව සිටියේ ය.

1963 සැප්තැම්බර් 17 වැනි ද සිට දෙසැම්බර් 20 වැනිදා දක්වා පැවැති එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ 18 වැනි සැසි වාරයට සහභාගි වූ ලංකා නියෝජිත පිරිසේ උපදේශකයා වශයෙන් ඇම්.පී. පෙරේරා මහතා රජයෙන් පත් කරනු ලැබීය.

සමාලෝචනයට භාජන වූ වර්ෂය තුළ පහත සඳහන් නිලධාරීන්ගෙන් සමහරෙක් තාවකාලික ලෙස රජයේ සේවාවට දුන් අතර, සමහර දෙනෙක් රජයේ තාවකාලික සේවාවේ වැඩිදුරටත් නිරතව සිටියහ.

| | | |
|---|---|---|
| පී. එච්. සිරිවර්ධන මහතා | — | ජාතික ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ වශයෙන් වැඩිදුරටත් රජයේ සේවාවෙහි නිරත විය. |
| ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න මහතා | — | ලංකා ඛනිජ තෙල් නීති ගත සංස්ථාවෙහි, වාණිජ කළමනාකරු වශයෙන් සේවාව සඳහා මුදා හරින ලදී. |
| ආචාර්ය එම්. ආර්. පී. සල්ගාදු මහතා | — | කෘෂිකර්ම, ආහාර හා සමුපකාර පිළිබඳ අමාත්‍යාංශයේ සේවාව සඳහා මුදා හරින ලදී. |
| පී. බී. කරඳවල මහතා | — | මුදල් අමාත්‍යාංශයේ සේවාව සඳහා මුදා හරින ලදී. |

මහ බැංකුවේ නිලධාරීහු ගණනක් ම රජය විසින් පත් කරනු ලැබූ නොයෙකුත් කමිටු වල තවදුරටත් සේවාව කිරීමෙහි නියුතු වූහ.